**1. තනතුර - පුනරුත්ථාපන නිලධාරි**

**2. වයස** - අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3. සුදුසුකම්**

අ. **බාහිර අයදුම්කරුවන්**

උපදේශන මනෝ විද්‍යාව/ මනෝ විද්‍යාව / සමාජ විද්‍යාව / අපරාධ විද්‍යාව හෝ මෙම තනතුර සඳහා අදාල වන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම සමග තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

ආ. **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4. <u>වැටුප් තලය</u>**

ස්ථිර වැටුප් පරිමාණය - MA 5-2 2025
මූලික වැටුප - රු. 56,899.00 (2026), රු. 62,310.00 (2027)
ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.
වාර්ෂික වැටුප - 56,899.00+17800.00 x 12 = රු. 896,388.00 (2026)
- 62,310.00+17800.00 x 12 = රු. 961,320.00 (2027)

**5. <u>රාජකාරී ස්වභාවය</u>**

i. නේවාසික පුනරුත්ථාපන කාලය තුළ පුනරුත්ථාපනලාභීන් හඳුනාගැනීම, පුනරුත්ථාපනලාභීන්ගේ පවුල් පරිසරය සොයා බැලීම.

ii. පුනරුත්ථාපනලාභියා සහ දෙමව්පියන් එකිනෙකා සම්බන්ධ කිරීම, පුනරුත්ථාපනලාභීන්ගේ ප්‍රශ්න පිළිබඳව හඳුනාගැනීම සහ එම ගැටළු නිරාකරණය කර ගැනීමට සහාය ලබාදීම.

iii. පුනරුත්ථාපනලාභීන් සමාජගත කිරීමෙන් අනතුරුව ඔහුට සමාජයේ යහපත් පුරවැසියකු වශයෙන් ජීවත් වීමට අවැසි වටපිටාවක් නිර්මානය කිරීම, ඔහු සම්බන්ධ ඔහුගේ චර්යා රටාව අධ්‍යයනය කොට දත්ත රැස් කිරීම, එම දත්ත විශ්ලේෂනය කොට නිගමන වලට එළඹීම

iv. ආර්ථික සහ සුභසාධනය නගාසිටුවීම සඳහා රැකියා අවස්ථාවන් සඳහා යොමු කිරීම, ඔවුනට අවැසි උපදේශන සේවා සැපයීම මඟින් නැවත භාවිතයට යොමු වීමට ඇති ඉඩ ප්‍රස්ථාවන් අවම කරලීම/ සංවෘත කිරීම

v. කාර්යාංශයේ අනුමැතිය මත උසස් මූලස්ථාන හා අනෙකුත් විශේෂ ආයතන සඳහා පුනරුත්ථාපනලාභීන්ගේ / සමාජගත වූවන්ගේ දත්ත ලබා දීමේ දී එම දත්තයන්හි නිරවද්‍යතාවය මෙන්ම ආරක්ෂිත භාවය තහවුරු වන අයුරින් කාලෝචිතව ක්‍රියා කිරීම

vi. පුනරුත්ථාපනලාභීන්ගේ දත්ත යාවත්කාලීන කිරීම තුලින් සමාජගත අභ්‍යාස ලාභීන්ගේ අනාගත අභිවෘද්ධිය ඇති කිරීමට ගත යුතු ක්‍රියාමාර්ග හා ඔවුන් පිලිබඳ නිරන්තර පසු විපරම තුලින් අඛණ්ඩව අභ්‍යාසලාභීන්ගේ සුභසාධනය සඳහා අවැසි කටයුතු සම්පාදනය සඳහා රාජ්‍ය/ රාජ්‍ය නොවන ආයතනයන් සම්බන්ධීකරණය තුලින් අවස්ථාවන් සලසා ගැනීමට ක්‍රියා කිරීම

vii. පුනරුත්ථාපනලාභීන්ගේ / සමාජගත වූවන්ගේ දත්ත පද්ධතිය නිවැරදිව යාවත්කාලීන කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED